අලව්ව ප්‍රාදේශීය සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය
--------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

1.1 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 31 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 28 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2014 නොවැම්බර් 28 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට අලව්ව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය තුල ලැබී තිබුණු වරිපනම් බදු දඩ රු.21,804 ක් හා වරිපනම් බදු කලින් ලැබීම් රු.43,206 ක් සඳහා ගිණුම්වල අවශ්‍ය ගැලපීම් නොකිරීම නිසා වර්ෂයේ වරිපනම් බදු ආදායම රු.65,010 ක් වැඩියෙන්ද, වරිපනම් බදු දඩ ආදායම හා වරිපනම් බදු කලින් ලැබීම් පිළිවෙලින් රු.21,804 ක් හා රු.43,206 ක් අඩුවෙන්ද ගිණුම් ගතකර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුල වරිපනම් බදු සඳහා දුන් වට්ටම් රු.55,546 ක් ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ආ). භාණ්ඩ සමීක්ෂණය අනුව හඳුනාගෙන තිබුණු සභාවට අයත් අක්කර 37 රූඩ 24 ක් වූ සුසාන භූමි 40 කද, සෙවිලි තහඩු 28 කද, පොල් පරාල දික් අඩි 10 කද සහ අංක 46-0524 දරන ට්‍රේලරයේද වටිනාකම් ගණනය කර ගිණුම් ගතකර නොතිබුණි. තවද රු.696,500 කට අගය කර තිබුණ අක්කර 45 ක් වූ සුසානභූමි 45 ක්ද, රු.215,000 කට අගය කර තිබුණ ගරාජය හා සුසානාගාර 05 ක්ද ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඇ). සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු මුද්දර ගාස්තු ශේෂය රු.18,390,980 ක් වුවද, මුද්දර ගාස්තු ලේඛණය අනුව එය රු.9,396,681 ක් වූයෙන් ආදායම් ණයගැතියෝ (මුද්දර ගාස්තු) ශේෂය රු.8,994,299 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ). සාරාංශ මුදල් පොත (ප්‍රා.ස.10) අනුව මුදල් ගිණුම් 3 කට අදාලව වර්ෂය අවසානයට ශේෂයන්ගේ එකතුව රු.2,997,396 ක් වුවද, මූල්‍ය ප්‍රකාශන වලට එය රු.5,587,790 ක් ලෙස රු.2,590,394 ක් වැඩියෙන් ගෙන තිබුණි.

1.3.2 <u>අසම්භාව්‍ය බැරකම්</u>

ප්‍රාදේශීය සභාවේ සේවය කර විශ්‍රාම ලබා ඇති පළාත් පාලන විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතු සේවකයන්ට අදාලව සභාව විසින් එම අරමුදලට ගෙවිය යුතු දායක මුදල් නිසි පරිදි නොගෙවීම නිසා සමාලෝචිත වර්ෂය අවසානය වන විට එම අරමුදලට ගෙවිය යුතු ශේෂය රු.7,788,765 ක්ව තිබුණි.

1.3.3 <u>නොසැසඳු පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාල බිල් කිරීම්,ලැබීම් හා අවසාන ශේෂය යටතේ ගිණුම් විෂයයන් 13 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛන අනුව අනුරූපී අගයන් අතර රු. 1,687,651 ක නොසැසඳීම් පැවතුණි.

1.3.4 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

2013 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතුව තිබූ ගිණුම් ශේෂවල වටිනාකම රු.29,647,537 ක් වූ අතර, ඒයින් රු. 7,869,822 ක් වසර 3 කට වඩා පැරණි ශේෂයන් විය. එමෙන්ම 2011 වර්ෂයේ සිට නිරවුල් නොවී පවතින නාරම්මල ප්‍රාදේශීය සභාව නමින් රු.499,813 ක ශේෂයක්ද එතුල පැවතුණි.

1.3.5 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු. 4,976,311 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

1.3.6 <u>අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව සේවක ණය ගිණුමේ ශේෂය, සේවක ණය උපලේඛණය හා සමාන කිරිම සඳහා නිසි අධිකාරි බලයකින් තොරව සේවක ණය ගිණුමට රු.75,448 ක් හර කර තිබුණි.

(ආ). සමාලෝචිත වර්ෂය තුලදී ගිණුම් ශේෂ නිවැරදි කිරීම සඳහා ජ'නල් සටහන් අංක 30 මගින් පුස්තකාල පොත් ශේෂය රු.1,099,102 කින් කපාහැර තිබුණි.

2 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,473,513 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,299,052 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.174,461 ක වර්ධනයක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.24,909,334 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.26,120,143 ක් වූ ප්‍රාග්ධන වියදම් ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල අතිරික්තය රු.3,262,704 දක්වා අඩුවී තිබුණි.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ). සමාලෝචිත වර්ෂයට අදාලව සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.42,704,315 න් සියයට 68 ක් ලෙස රු.28,950,380 ක් උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු හා වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම් වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.24,909,334 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් සහා බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලද මුදල් විය.

(ආ). සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන වියදම වූ රු.38,229,802 න් සියයට 77 ක් ලෙස රු.29,418,321 ක් පෞද්ගලික පඩිනඩි වියදම වූ අතර, ඉන් සියයට 66 ක් ලෙස රු.19,404,130 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.26,120,143 න් සියයට 7 ක් ලෙස රු.1,691,277 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබුණු අතර, ඉතිරි සියයට 93 ක් වූ රු.24,428,866 ක ප්‍රමාණය ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභව මත වෙනත් ආයතන ප්‍රතිපාදන වලින් ඉටුකල සංවර්ධන කාර්යයන් විය.

2.3 <u>කාරක ප්‍රාග්ධන කළමනාකරණය</u>

නාරම්මල ප්‍රාදේශීය සභාව, 2011 අප්‍රේල් 01 දින සිට නාරම්මල හා අලව්ව ප්‍රාදේශීය සභාව වශයෙන් ප්‍රාදේශීය සභා දෙකක් ලෙස වෙන් කිරීමේදී අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ජංගම ගිණුම් 3 ක් යටතේ සත්‍ය ලෙස පැවරූ මුදල් ශේෂයන් හා විභජනය කරන ලද ශේෂ පත්‍රයෙහි ජංගම ගිණුම් ශේෂයන් අතර පැවති රු.3,224,132 ක නොසැසඳීම් සමාලෝචිත වර්ෂය අවසානය දක්වාම නිරවුල් කර නොතිබුණි.

2.4 <u>ආදායම් පරිපාලනය</u>

2.4.1 <u>ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර ගාස්තු</u>

සභාව විසින් ප්‍රසිද්ධ කරන ලද 2012 ඔක්තෝබර් 19 දිනැති ගැසට් නිවේදනය ප්‍රකාරව 2013 වර්ෂයට අදාලව ව්‍යාපාර බදු හා වෙළඳ බලපත්‍ර යටතේ අයකල යුතු ගාස්තු ප්‍රමාණයන්ට වෙනස් වූ ගාස්තු ප්‍රමාණයක් අයකර තිබුණු අවස්ථා 24 ක් නිරීක්ෂණය විය.

2.4.2 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු උසාවි දඩ රු.381,375 ක් විය.

3. <u>මෙහෙයුම් සමාලෝචනය</u>

3.1 <u>කාර්ය සාධන ඇගයීම</u>

සභාව විසින් සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ රු.3,157,000 ක් වූ ව්‍යාපෘති 17 ක් විවිධ හේතූන් නිසා අවලංගු කර තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුල ඉටුකිරීමට සැලසුම් කර තිබූ සුභසාධන කාර්යයන් 07 ක් වෙනුවෙන් වෙන්කල රු.695,000 න් රු.639,000 ක් එකී කාර්යයන්ට නොයොදවා පරිපාලන කටයුතු සඳහා යොදවාගෙන තිබුණ අතර, රු.240,000 ක් වටිනා සුභසාධන කාර්යයන් 15 ඉටුකර නොතිබුණි.

3.2 <u>කළමනාකරණ අකාර්යක්ෂමතා</u>

පහත සඳහන් දුර්වලතාවයන් නිරීක්ෂණය කරනු ලැබේ.

(අ). කැප්පිටිවලාන උපකාර්යාලයට අයත් පොදු වෙළඳපල අංක 06 සහ 13 දරන කඩ කාමර බදුගෙන තිබූ පාර්ශව විසින් බදු ගිවිසුමෙහි ඇතැම් වගන්ති උල්ලංඝණය කරමින් අදාල ව්‍යාපාරික ස්ථානයෙහිම පදිංචිව සිට යාබද ව්‍යාපාරික ස්ථාන වලට අවහිර වන ආකාරයට විවිධ ද්‍රව්‍ය රැස්කර ඇති බව වාර්තා වී තිබුණි.

(ආ). සභාව විසින් 2009 - 2011 කාලය තුල අනුමත කල ගොඩනැගිලි අයදුම්පත් 109 ක් තිබුණද, අනුකූලතා සහතික 18 ක් ලබාදී තිබුණි. අයදුම්පත්‍ර 91 ක් සඳහා අනුකූලතා සහතික ලබා නොගැනීම හෝ ගොඩනැගිලි බලපත්‍ර කාලය දීර්ඝ කරවා නොගැනීම පිළිබඳව සභාව ක්‍රියා මාර්ග ගෙන නොතිබුණි. එම ගොඩනැගිලි සියල්ල ඉදිකර තිබුණි නම් සභා අතුරු ව්‍යවස්ථා අනුව රු.45,500 ක ගොඩනැගිලි අනුකූලතා සහතික පත් ආදායමක්ද අදාල ගොඩනැගිලි ඉදිකිරීම අවසන්ව නොමැති නම් බලපත්‍ර කාලය වාර්ෂිකව දීර්ඝ කරවා ගැනීමේ ගාස්තු ලෙස රු.154,500 ක ආදායමක්ද සභාවට උපයාගත හැකිව තිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

2011 පළාත් නිශ්චිත ආධාර යටතේ උඩකන්ද ජල ව්‍යාපෘතිය සඳහා ෆෙරෝ සිමෙන්ති ටැංකියක් ඉදිකිරීමේ කර්මාන්තය 2013 වර්ෂය වන විටද වැඩ නිම වී නොතිබුණි. ටැංකිය ඉදිකිරීමට අදාල කොන්ක්‍රීට් පුවරුව දක්වා වූ වැඩ පමණක් අවසන්ව තිබූ අතර, ඒ වෙනුවෙන් රු.341,420 ක කොටස් ගෙවීමක් සිදුකර තිබුණි.

4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

4.1 අයවැය ලේඛනමය පාලනය

සමාලෝචිත වර්ෂයට අදාල අයවැය ලේඛණය අනුව කුලී හා බලපත්‍ර ගාස්තු සඳහා රු.9,180,000 ක ආදායමක් ඇස්තෙමින්තුගත කර තිබුණද, එයින් උපයා තිබුනේ සියයට 86 ලෙස රු.7,884,561 ක් පමණි. එමෙන්ම ප්‍රාග්ධන ආදායම් යටතේ රු.89,000,000 ක් ඇස්තමේන්තු කර තිබුණද ඉන් උපයා තිබුණේ සියයට 28 ක් ලෙස රු.24,909,000 ක් පමණි

5. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ). ගිණුම්කරණය

(ආ). අයවැය පාලනය

(ඇ). මූල්‍ය පාලනය

(ඈ). ආදායම් පරිපාලනය

(ඉ). ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම